# මහ ඡන්දයට විදෙස්...

මෙවර පාර්ලිමේන්තු මැතිවරණය සඳහා විදේශ නිරීක්ෂකයන් කිහිපදෙනකු කොරෝනා වයිරසය පාලනය වී ඇති රටවල් කිහිපයකින් කැඳවීමට මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇති බව 'පැෆරල්' සංවිධානය සඳහන් කරයි. ඒ අනුව විදේශීය නිරීක්ෂකයන් 15 දෙනකු පමණ පැමිණෙනු ඇතැයි එම සංවිධානය පවසයි.

එසේ පැමිණෙන කණ්ඩායම පී.සී.ආර්. පරීක්ෂණයකට භාජන කර දින 14ක් නිරෝධායනයට යටත් කෙරෙන බවද එම සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි සඳහන් කරයි.